# ප්‍රාථමික පාසල ආරම්භ කිරීම?

පාසල් ආරම්භ කිරීම ළමුන්ට, දෙමාපියන්ට හා රැකබලාගන්නන් හට විශේෂ අවස්ථාවකි. ප්‍රාථමික පාසලේ පළමු වසර පදනම් අදියරය හෝ පෙර සූදානම් අදියරය ලෙස හැඳින්වේ. වික්ටෝරියානු ප්‍රාන්තයේ රජයේ ප්‍රාථමික පාසලකට ඇතුල් වීම සඳහා, ඔබේ ළමයා පාසල් ආරම්භ කිරීමට වසරකට පෙර පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න

## ඉල්ලුම් පත්‍රයක් පිරවීමට පෙර

කවදා කෙසේ ඇතුල්විය හැකිද යන්න ගැන ගැන අපේ වෙබ් අඩවියෙන් කියවන්න

ඔබේ ළමයා පාසල් ආරම්භ කිරීමට නිසි වයසේ සිටීදැයි සහතික කරගන්න

ඔබේ ප්‍රදේශයේ පාසල සහ අනිකුත් ලඟපාත රජයේ පාසල් **findmyschool.vic.gov.au** වෙතින් සොයාගන්න

සංචාරයක් හෝ පැමිණ හමුවීමක් වෙන්කරවා ගැනීමට ප්‍රාථමික පාසල අමතන්න

## පදනම් ඇතුල්වීමට ඉල්ලුම් කිරීම

ප්‍රාථමික පාසලෙන් ඉල්ලුම් පත්‍රයක් ලබාගන්න

අවශ්‍ය ලිපි ලේඛන එකතු කරගන්න

නියමිත දිනයට (ජූලි මස අන්තිම සිකුරාදා) සියලු දේ ප්‍රාථමික පාසලට බාරදෙන්න

පාසල විසින් ඔබව අමතන තුරු පොරොත්තුව සිටින්න (අගෝස්තු මස පලමු සති දෙකේදී)

**වැඩිදුර තොරතුරු සහ පරිවර්තිත සම්පත් මෙතනින් ඔබට සොයා ගත හැකිය:**

ඇතුල්වීම
පදනම් (Prep ) |
වික්ටෝරියානු රජය

THE EDUCATION STATE

VICTORIA State Government | Department of Education

23-082